සිය සහෝදරියගේ බාලවයස් දියණිය හට ලිංගික අපරාධයක් සිදු කිරීමේ චෝදනාවට, වරදකරු විශ්‍රාමික හමුදා නිලධාරියෙකුට සිර දඬුවම් හිමිවීමේ පුවත, සැප්තැම්බර් 27, 2023 දින පුවත්පත් කිහිපයක් තුළ අවධානයට ලක් වී තිබිණි.

එහිදී, එම සිංහල භාෂා පුවත්පත් ඔස්සේ, එම ලිංගික අපරාධය සම්බන්ධයෙන් දැක්වී තිබුණේ මේ ආකාරයෙනි.

ඔබ සිතන ලෙසට,

1) ලිංගික අපරාධයක් හැඳින්වීම සඳහා, මෙහිදී ලංකාදීප, දිවයින සහ දිනමිණ පුවත් යොදා ගෙන ඇති "දූෂණය" හෝ "කෙලෙසීම" වැනි යෙදුම් ඔස්සේ, ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකු අපවිත්‍ර වී ඇති බවක්, කිළිටි වී ඇති බවක් නොහැඟවෙන්නේ ද?

2) එය ලිංගික අපරාධයන්ට මුහුණ දුන් අය සම්බන්ධයෙන් සමාජයේ තවමත් පවතින ගර්හාව තවත් තීව්‍ර කිරීමට හේතුවක් නොවන්නේ ද?

